ඔබ පැතූ දෑ ද ඒ සමගම ඒ හා සමාන දෙයක් ද ඔබට හිමිය" යැයි පවසනු ඇත

අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් ප්රකාශ කළ බව
අබූ හුරෙයිරා (රළියල්ලාහු අන්හු) තුමා විසින් මෙසේ වාර්තා කරන ලදී: "ස්වර්ගයේ ඔබ අතුරින් කෙනෙකුට හිමි අවම නිලය වනුයේ: ඔබ පතනු" යැයි ඔහුට කියනු ලැබෙයි. එවිට ඔහු
පතයි. නැවතත් පතයි. එවිට "ඔබ පැතුවෙහිදැ?" යි විමසයි. එවිට ඔහු: "එසේය" යැයි පවසයි.
එවිට ඔහුට: "ඔබ පැතූ දෑ ද ඒ සමගම ඒ හා සමාන දෙයක් ද ඔබට හිමිය" යැයි පවසනු ඇත.
[صحيح] [رواه مسلم]

ස්වර්ගයට පිවිසෙන්නන් හට ස්වර්ගයේ පවතින අවම නිලය අවම මට්ටම ගැන නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණෝ මෙසේ දන්වා සිටියහ: එය, "ඔබ පතනු"යි ඔහුට කියනු ලැබෙයි. එවිට ඔහු පතයි. නැවතත් පතයි. ඔහුට කීමට තරම් කිසිදු ආශාවක් ඉතිරිව නොපවතින තරමට පතයි. එවිට ඔහුට: "ඔබ පැතුවෙහිදැ?"යි විමසයි. එවිට ඔහු: "එසේය" යැයි පවසයි. එවිට ඔහුට:"ඔබ පැතූ දෑ ද ඒ සමගම ඒ හා සමාන තවත් දෙයක් ද ද ඔබට හිමිය" යැයි පවසනු ඇත.

https://sunnah.global/hadeeth/si/show/8342